*සැ. යු.*- 2022.03.11 දින පළ වූ අංක 2,271 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,272 - 2022 මාර්තු මස 18 වැනි සිකුරාදා - 2022.03.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 420 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 429 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | -- |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | -- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


*සැ. යු.* - සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මාර්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අප්‍රේල් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2020 පෙබරවාරි මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.3 යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එම්. ටී. එන්. කරුණාසේන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

2022 මාර්තු මස 09 වැනි දින,
කුරුණෑගල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සිතියමෙන් සහ උපලේඛනයෙන් විස්තර කරන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීමට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින්, දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට කුරුණෑගල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියා කළ යුතු බවත්, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි හිරිපිටිය නගරයේ වර්ග කිලෝමීටර් 2.27 ක් හා පරිමිතිය වර්ග කිලෝමීටර් 15.7ක් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට යෝජිත ප්‍රදේශයේ භූගෝලීය ඛණ්ඩාංකවලින් හා අදාළ මායිම් හිමිකරුවන්ගේ නාමලේඛනය.

*අක්ෂාංශ හා දේශාංශ ස්ථාන විස්තර කිරීම*


*හිරිපිටිය කලාපය*

| *අංකය* | *අක්ෂාංශ* | *දේශාංශ* | *මායිම් විස්තරය* |
|---|---|---|---|
| 01 | 7.654238° | 80.377663° | හිරිපිටිය කුඹුක්ගැටේ පාර අසල සීමාව |
| 02 | 7.653511° | 80.379076° | දොඩංවටවන හන්දිය අසල සීමාව |
| 03 | 7.652760° | 80.378229° | වෙල්යාය අසල සීමාව |
| 04 | 7.653347° | 80.378349° | වෙල්යාය අසල සීමාව |
| 05 | 7.653441° | 80.377279° | වෙල්යාය අසල සීමාව |
| 06 | 7.654011° | 80.376957° | වෙල්යාය අසල සීමාව |
| 07 | 7.654257° | 80.375987° | සිත්ති පවුසියා මහතාගේ නිවස පිටුපස මායිම |
| 08 | 7.654285° | 80.375825° | එන්. සී. එම්. අන්වර් මහතාගේ නිවස පිටුපස සීමාව |

| අංකය | අක්ෂාංශ | දේශාංශ | මායිම් විස්තරය |
|---|---|---|---|
| 09 | 7.653219° | 80.375367° | විජේරත්න මහතාගේ නිවස පිටුපස වෙල්යාය සීමාව |
| 10 | 7.652698° | 80.374931° | එච්. එස්. පී. කලුමහතාගේ නිවස පිටුපස වෙල්යාය සීමාව |
| 11 | 7.652338° | 80.374623° | එස්. පී. ජයා මහතාගේ නිවස පිටුපස වෙල්යාය අසල මායිම |
| 12 | 7.651754° | 80.374568° | වෙල්යාය අසල සීමාව |
| 13 | 7.652080 | 80.373780° | එස්. එම්. එමලින් මහත්මියගේ නිවස අසල මායිම |
| 14 | 7.652623° | 80.373903° | ආර්. පී. විමලසිරි මහතාගේ නිවස අසල මායිම |
| 15 | 7.654747° | 80.373155° | දයාරත්න ඉන්ධන පිරවුම්හල පිටුපස සීමාව |
| 16 | 7.654700° | 80.372388° | වෙල්යාය අසල සීමාව |
| 17 | 7.653148° | 80.371985° | ගුණතිලක මහතාගේ නිවස පිටුපස සීමාව |
| 18 | 7.651548° | 80.371813° | හිරිපිටිය කුරුණෑගල පාර අසල සීමාව |
| 19 | 7.648890° | 80.371780° | ඒ. කේ. එම්. කුමාරසිංහ මහතාගේ වෙළඳසැල, නිවස අසල මායිම |
| 20 | 7.646527° | 80.373052° | ඔතුවෙල පාර සීමාව |
| 21 | 7.651902° | 80.367273° | හිරිපිටිය වැව අසල මායිම |
| 22 | 7.653240° | 80.366462° | වෙල්යාය අසල සීමාව |
| 23 | 7.652689° | 80.365554° | සිසිර බංඩාර මහතාගේ නිවස පිටුපස වෙල අසල මායිම |
| 24 | 7.652414° | 80.364960° | ධම්මාලෝක මාවත අසල මායිම |
| 25 | 7.652820° | 80.364796° | හිරිපිටිය පන්සල පිටුපස සීමාව |
| 26 | 7.652975° | 80.363187° | වෙල්යාය අසල සීමාව |
| 27 | 7.653499° | 80.360488° | විමලසේන මහතාගේ නිවස අසල වෙල්යාය සීමාව |
| 28 | 7.654271° | 80.360156° | පොදු ළිඳ අසල සීමාව |
| 29 | 7.654323° | 80.358866° | ගනේවත්ත හිරිපිටිය පාර අසල මායිම |
| 30 | 7.651684° | 80.359295° | මකුල්මඩේ පාර කෙලවර මායිම |
| 31 | 7.650891° | 80.354734° | අයි. බී. අබේ මහතාගේ නිවස පිටුපස මායිම |
| 32 | 7.651943° | 80.354157° | ඩී. එම්. බංඩාර මහතාගේ නිවස පිටුපස මායිම |
| 33 | 7.651983° | 80.353793° | අබේරත්න මහතාගේ නිවස පිටුපස මායිම |
| 34 | 7.651709° | 80.352131° | අංක 36, අබේකෝන් මහතාගේ වත්ත අසල සීමාව |
| 35 | 7.651730° | 80.351716° | අංක 34/3, ටී. බී. අතපත්තු මහතාගේ නිවස පිටුපස මායිම |
| 36 | 7.651764° | 80.351181° | අංක 34/1, පී. බී. අතපත්තු මහතාගේ නිවස පිටුපස මායිම |
| 37 | 7.651636° | 80.350941° | අංක 32, ඩී. එම්. දසනායක මහතාගේ නිවස පිටුපස මායිම |
| 38 | 7.650584° | 80.349625° | අංක 24/09, සරත් ගාමිණී බංඩාර මහතාගේ නිවස පිටුපස මායිම |
| 39 | 7.652097° | 80.348962° | අංක 24/08, සරත් ගාමිණී දෙමහල් නිවස පිටුපස මායිම |

| අංකය | අක්ෂාංශ | දේශාංශ | මායිම් විස්තරය |
|---|---|---|---|
| 40 | 7.652301° | 80.348975° | හිඳවැව පාර මායිම |
| 41 | 7.652528° | 80.348853° | අංක 333/11, කුඹුර අසල මායිම |
| 42 | 7.652846° | 80.348302° | ගනේවත්ත දුම්රිය මාර්ගය අසල මායිම |
| 43 | 7.654016° | 80.347668° | අංක 337/03, එස්. වයි. එස්. බී. හේරත් මහතාගේ නිවස පිටුපස මායිම |
| 44 | 7.654586° | 80.345686° | ගනේවත්ත පාර මායිම |
| 45 | 7.655744° | 80.345397° | ගනේවත්ත පාර අසල මායිම |
| 46 | 7.657690° | 80.346334° | අංක 330/01/ඒ. එස්. මලර් පුෂ්පා මහතාගේ නිවස පිටුපස මායිම |
| 47 | 7.656821° | 80.346801° | ගනේවත්ත ප්‍රා. ලේකම් කාර්යාලය ඉදිරිපිට මාර්ගය අසල මායිම |
| 48 | 7.657779° | 80.347652° | ගනේවත්ත ලේකම් කාර්යාලය පිටුපස වැට මායිම |
| 49 | 7.657422° | 80.348241° | ලේකම් කාර්යාලය අසල සුසාන භූමිය අසල සීමාව |
| 50 | 7.658176° | 80.348823° | දුම්රිය මාර්ගය අසල මායිම |
| 51 | 7.658356° | 80.349131° | ගනේවත්ත කැකුළාවල පාර සීමාව |
| 52 | 7.658460° | 80.349419° | අංක 260, ඩබ්. එම්. කපිල වීරසිංහ මහතාගේ ව්‍යාපාරික ස්ථානය අසල වෙල්යාය මායිම |
| 53 | 7.659281° | 80.350558° | අංක 51/06, කොහුබත් මෝල පිටුපස වෙල අසල මාර්ගය |
| 54 | 7.660822° | 80.351324° | නැලව, අළුත්ගම මාර්ගය සීමාව |
| 55 | 7.659891° | 80.352227° | අංක 51/12, යූ. එච්. මාලනී මහත්මියගේ නිවස පිටුපස වෙල ළඟ මායිම |
| 56 | 7.659228° | 80.352361° | අංක 51/13, ආනන්ද මහතාගේ නිවස පිටුපස වෙල ළඟ මායිම |
| 57 | 7.658472° | 80.352801° | අංක 61/A, කේ. එච්. අනුර රත්නසිරි මහතාගේ නිවස පිටුපස වෙල ළඟ මායිම |
| 58 | 7.659124° | 80.353718° | අංක 73/5, වරිපනම් අංක දරන දේපල අසල වෙල්යාය අසල මායිම |
| 59 | 7.659384° | 80.353837° | අංක 73/6, අයි. එච්. රන්කිරා මහතාගේ නිවස අසල මායිම |
| 60 | 7.659051° | 80.354312° | අංක 79/08, එන්. එච්. පුංචි ටිකිරා මහතාගේ නිවස පිටුපස වෙල්යාය ළඟ මායිම |
| 61 | 7.658748° | 80.354547° | අංක 73/09, රුවන් කුමාර මහතාගේ නිවස පිටුපස වෙල ළඟ මායිම |
| 62 | 7.657877° | 80.355697° | අංක 79/02, ආර්. එච්. සාපින් මහතාගේ නිවස පිටුපස වෙල ළඟ මායිම |
| 63 | 7.657575° | 80.356368° | අංක 89, පී. කේ. සෝමාවතී මහත්මියගේ නිවස පිටුපස වෙල අසල මායිම |
| 64 | 7.656335° | 80.357577° | අංක 194/14, ජී. ආර්. විජේපාල මහතාගේ නිවස පිටුපස වෙල අසල මායිම |
| 65 | 7.655964° | 80.357763° | අංක 194/16, ජී. ආර්. විජේපාල මහතාගේ නිවස පිටුපස වෙල අසල මායිම |
| 66 | 7.654823° | 80.357564° | නැලව, ශ්‍රී ජය මාවත අසල වෙල්යායේ මායිම |
| 67 | 7.654611° | 80.360019° | වෙල්යාය අසල මායිම |
| 68 | 7.655108° | 80.360399° | අංක 180, ඉන්ද්‍රානි නිශ්ශංක යන අයට අයත් නිවස පිටුපස මායිම |
| 69 | 7.655558° | 80.361731° | අංක 170, ආර්. එම්. සෝමසිරි මහතාගේ නිවස පිටුපස මායිම |
| 70 | 7.655592° | 80.362024° | අංක 166, ඩබ්. කේ. නිශ්ශංක මහතාගේ නිවස පිටුපස මායිම |

| අංකය | අක්ෂාංශ | දේශාංශ | මායිම් විස්තරය |
|---|---|---|---|
| 71 | 7.655705° | 80.362510° | අංක 160, අතුල හේරත් මහතාගේ නිවස පිටුපස මායිම |
| 72 | 7.655900° | 80.363205° | අංක 150/10, එස්. ආර්. ජයසුන්දර මහතාගේ නිවස පිටුපස මායිම |
| 73 | 7.655928° | 80.363252° | ප්‍රාදේශීය සභාවට අයත් කුඩා මාර්ගය කෙලවර සීමාව |
| 74 | 7.655930° | 80.363486° | අංක 150/14, පොල් ලී මඩුව වෙල අසල මායිම |
| 75 | 7.655736° | 80.363900° | අංක 138/03, එම්. ජී. මේරි ඇග්නස් මහත්මියගේ නිවස අසල වෙල ළඟ මායිම |
| 76 | 7.655685° | 80.364004° | ප්‍රාදේශීය සභාවට අයත් කුඩා මාර්ගය කෙලවර සීමාව |
| 77 | 7.655467° | 80.364746° | අංක 128, ජී. කේ. සිරිසේන මහතාගේ නිවස පිටුපස මායිම |
| 78 | 7.655444° | 80.365071° | අංක 122, ගුණතිලක මහතාගේ නිවස පිටුපස මායිම |
| 79 | 7.655455° | 80.365635° | අංක 112/A, ආර්. ඩී. කුසුමාවතී මහත්මියට අයත් වෙළඳසැල පිටුපස මායිම |
| 80 | 7.655479° | 80.365846° | අංක 112, ආර්. ඩී. කුසුමාවතී මහත්මියට අයත් දේපළ පිටුපස මායිම |
| 81 | 7.655667° | 80.366234° | හිරිපිටිය උපකාර්යාලය පිටුපස මායිම |
| 82 | 7.656388° | 80.366404° | වෙල්යාය අසල සීමාව |
| 83 | 7.657114° | 80.367171° | හිරිපිටිය පොල පිටුපස වැට මායිම |
| 84 | 7.657847° | 80.367269° | සභාව සතු පොදු ඉඩම් කොටසේ පිටුපස වැට මායිම |
| 85 | 7.658554° | 80.366584° | මැහි ඇල්ල ප්‍රධාන මාර්ගය අසල මායිම |
| 86 | 7.659480° | 80.367329° | අංක 37/12 වරිපනම් අංක දරන දේපළ අසල මායිම |
| 87 | 7.659933° | 80.366633° | අලුත්ගම මාර්ගය සීමාව |
| 88 | 7.659910° | 80.368383° | අංක 43/11, පී. එස්. එම්. ගුණතිලක ඉඩම අසල මායිම |
| 89 | 7.660193° | 80.368390° | අංක 43/13, චන්ද්‍රාවතී අධිකාරි මහත්මියගේ නිවස පිටුපස වැට මායිම |
| 90 | 7.660563° | 80.368566° | ලක්ෂ්මන් ගාමිණී මහතාගේ නිවස ඉදිරිපිට පාර අසල මායිම |
| 91 | 7.661206° | 80.368456° | අංක 69/10 වරිපනම් දේපල ඉදිරිපිට මාර්ගයේ මායිම |
| 92 | 7.661209° | 80.368473° | ආර්. එම්. හීංබංඩා මහතාට අයත් දේපළ අසල මායිම |
| 93 | 7.660645° | 80.369941° | කළුගල්ල ගල්කැටිගම මාර්ගය අසල මායිම |
| 94 | 7.659518° | 80.369678° | අංක 56, වික්ටර් ප්‍රනාන්දු මහතාගේ නිවස අසල මායිම |
| 95 | 7.659375° | 80.370096° | ක්‍රිස්තියානි පල්ලිය පිටුපස වැට මායිම |
| 96 | 7.658409° | 80.369852° | අංක 44/A, වරිපනම් දේපළ අසල මායිම |
| 97 | 7.657778° | 80.369570° | අංක 24, ජී. කේ. ගුණතිලක මහතාගේ කඩය පිටුපස මායිම |
| 98 | 7.657611° | 80.371314° | චේන්ජ්රිච් හෝටලය ඉදිරිපස මායිම |
| 99 | 7.657846° | 80.372776° | පාලුගම වත්ත පාර මායිම |
| 100 | 7.656707° | 80.372623° | නීරාවිය පාර සීමාව |
| 101 | 7.655762° | 80.374358° | වෙල්යාය මැද සීමාව |
| 102 | 7.655307° | 80.374337° | අංක 55, ශිවපාක්‍යම් මහත්මියගේ නිවස පිටුපස සීමාව |


හිරිපිටිය දියුණු කළ ප්‍රදේශය - ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව
Hiripitiya Lake
Nelawa Lake
Makulmade Lake
Railway
Hiripitiya Kurunegala Road
Extent:
Perimeter :15.7 Kilometers
Area : 2.27 Square Kilometers
Data SourceGoogle Satelite Images And GPS Tracking
Desingned ByDOLG & A.W.D.J.S.Adhikaram/ R.R.G.B.W.W.D.S.Weraliyadda,Ibbagamuwa
25000 0 25000 50000 75000 100000 km

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2020 පෙබරවාරි මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 5.7 යටතේ සභාව සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලෙස කටයුතු කරන මා විසින් අනුමැතිය දෙනු ලැබූ බව මහජනතාව වෙත මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එම්. ටී. එන්. කරුණාසේන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

2022 මාර්තු මස 09 වැනි දින,
කුරුණෑගල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සිතියමෙන් සහ උපලේඛනයෙන් විස්තර කරන ප්‍රදේශය සඳහා උපරිම මට්ටමින් සේවාව ව්‍යාප්ත කිරීමට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇති හෙයින්, දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට කුරුණෑගල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියා කළ යුතු බවත්, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාතලේ මාර්ගය වර්ග කිලෝමීටර් 0.81 ක් හා පරිමිතිය වර්ග කිලෝමීටර් 9.93ක් දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට යෝජිත ප්‍රදේශයේ භූගෝලීය ඛණ්ඩාංකවලින් හා අදාළ මායිම් හිමිකරුවන්ගේ නාමලේඛනය.


*අක්ෂාංශ හා දේශාංශ ස්ථාන විස්තර කිරීම*

*මාතලේ පාර කලාපය*

| *අංකය* | *අක්ෂාංශ* | *දේශාංශ* | *මායිම් විස්තරය* |
|---|---|---|---|
| 01 | 7.561243° | 80.459378° | මාතලේ මාර්ගයේ සීමාව |
| 02 | 7.561586° | 80.459718° | අංක 11/1, ජේන්ජුල් ආබ්දීන් මහතාගේ නිවස පිටුපස සීමාව |
| 03 | 7.561490° | 80.460386° | අංක 13/4 දරන වරිපනම් දේපළ පිටුපස සීමාව |
| 04 | 7.561126° | 80.462393° | අංක 25, කේ. විපුලසේන නිවස පිටුපස මායිම |
| 05 | 7.561004° | 80.463501° | අංක 37, එස්. එම්. ඒ. සෙනවිරත්න මහතාගේ නිවස පිටුපස මායිම |
| 06 | 7.559730° | 80.463231° | අංක 37 දරන වරිපනම් දේපළ පිටුපස සීමාව |
| 07 | 7.558961° | 80.464694° | වෙල්යාය |
| 08 | 7.558328° | 80.465090° | අංක 61 දරන වරිපනම් දේපළ පිටුපස සීමාව |
| 09 | 7.558002° | 80.465668° | අංක 65, ප්‍රේමරත්න බංඩා මහතාගේ නිවස පිටුපස සීමාව |

| අංකය | අක්ෂාංශ | දේශාංශ | මායිම් විස්තරය |
|---|---|---|---|
| 10 | 7.557926° | 80.465830° | අංක 67, ඩබ්ලිව්. ආර්. එම්. සුවර්ණා කුමාරි මහත්මියගේ නිවස පිටුපස මායිම |
| 11 | 7.557280° | 80.466944° | අංක 73, ටී. පී. ලීලාවති මහත්මියගේ නිවස පිටුපස මායිම |
| 12 | 7.557273° | 80.467715° | පොදු සුසාන භූමිය, තල්ගොඩපිටිය |
| 13 | 7.556122° | 80.469098° | වන රක්ෂිතය, කිරිදිගල්ල |
| 14 | 7.557705° | 80.472029° | පල්ලම හේන මාර්ගයේ ආරම්භක ස්ථානය මාතලේ පාර අසල |
| 15 | 7.558502° | 80.472164° | පල්ලම හේන පාර සීමාව |
| 16 | 7.559090° | 80.472484° | අංක 91/3, එන්. ඩබ්ලිව්. සෝමදාස මහතාගේ නිවස පිටුපස මායිම |
| 17 | 7.559130° | 80.473319° | අංක 91/4, හේන්යාය මාර්ගය අසල ඇස්බැස්ටෝස් සෙවිලි නිවස පිටුපස මායිම |
| 18 | 7.559185° | 80.473621° | ඩබ්ලිව්. ජී. එච්. චන්ද්‍රරත්න මහතාගේ නිවස අසල මායිම |
| 19 | 7.559402° | 80.474443° | අංක 97, ඩී. එම්. රම්බංඩා මහතාගේ නිවස පිටුපස මායිම |
| 20 | 7.559707° | 80.474668° | අංක 101, කිරිබංඩා මහතාගේ නිවස පිටුපස සීමාව |
| 21 | 7.560045° | 80.474867° | අංක 103/103/01 දරන හිස් ඉඩම |
| 22 | 7.560373° | 80.475284° | අංක 105 දරන දේපළ පිටුපස මායිම |
| 23 | 7.560718° | 80.475517° | අංක 111 දරන දේපළ පිටුපස මායිම |
| 24 | 7.561781° | 80.477323° | අංක 125/1, රංජිත් ප්‍රේමරත්න මහතාගේ පොල්වත්ත සීමාව |
| 25 | 7.561722° | 80.479830° | කිරිදිගල්ල වැව අසල සීමාව |
| 26 | 7.563624° | 80.479359° | කිරිදිගල්ල වෙන්දේසි වත්ත සීමාව |
| 27 | 7.564072° | 80.480869° | උඩතම්මිට පාර සීමාව |
| 28 | 7.562858° | 80.480869° | කිරිදිගල්ල පාර සීමාව |
| 29 | 7.562889° | 80.482014° | කිරිදිගල්ල පාර සීමාව |
| 30 | 7.562242° | 80.482927° | අංක 153, එස්. එච්. ආර්. ඩී. කුසුමලතා නිවස අසල සීමාව |
| 31 | 7.561992° | 80.483376° | කිරිදිගල්ල වෙල්යාය සීමාව |
| 32 | 7.563425° | 80.483166° | අංක 161/05, දේපල ඉදිරිපිට මායිම |
| 33 | 7.564728° | 80.484560° | අංක 181/C/4, ප්‍රියන්ත වික්‍රමසිංහ මහතාගේ නිවස පිටුපස මායිම |
| 34 | 7.565403° | 80.488464° | වතු සංවර්ධන මංඩලය සීමාව |
| 35 | 7.565306° | 80.489406° | වල්පොල පාර |
| 36 | 7.564494° | 80.490346° | අංක 197, කුඹුරුවල ඔය අසල මායිම |
| 37 | 7.564344° | 80.490503° | මාතලේ පාර සීමාව |
| 38 | 7.563708° | 80.489366° | මාර්ග සංවර්ධන කාර්යාලය වැට මායිම |
| 39 | 7.562345° | 80.489775° | අංක 184/2, ඒ. එල්. විජේවර්ධන මහතාගේ නිවස පිටුපස මායිම |

| *අංකය* | *අක්ෂාංශ* | *දේශාංශ* | *මායිම් විස්තරය* |
|---|---|---|---|
| 40 | 7.562088° | 80.489144° | අංක 184/1, ඒ. එල්. විජේවර්ධන මහතාගේ නිවස පිටුපස මායිම |
| 41 | 7.562327° | 80.486179° | අංක 168, 168/A දරන දේපල සීමාව |
| 42 | 7.561339° | 80.483767° | රත්නජෝති මාවත |
| 43 | 7.560783° | 80.480938° | උබේසිංහ මහතාගේ නිවස මායිම |
| 44 | 7.560784° | 80.480897° | මැදලන්ද පාර |
| 45 | 7.560695° | 80.478693° | අංක 114/C/2 දරන දේපල සීමාව |
| 46 | 7.559620° | 80.476816° | අංක 98/03 දරන දේපල සීමාව |
| 47 | 7.559443° | 80.476599° | අංක 98/04 දරන දේපල සීමාව |
| 48 | 7.559184° | 80.476260° | අංක 96/A දරන දේපල සීමාව |
| 49 | 7.557200° | 80.474916° | ගාමිණි මහතාගේ නිවස මායිම |
| 50 | 7.557205° | 80.474818° | නිකමඩවත්ත මායිම |
| 51 | 7.558086° | 80.473940° | අංක 90 දරන දේපල සීමාව |
| 52 | 7.558088° | 80.473686° | අංක 88 දරන දේපල සීමාව |
| 53 | 7.557541° | 80.472999° | කිරිදිගල්ල ප්‍රාථමික විද්‍යාලය සීමාව |
| 54 | 7.556411° | 80.471405° | අංක 80, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 55 | 7.555292° | 80.469885° | රජයේ වැව සීමාව |
| 56 | 7.556495° | 80.465106° | රත්මල්ගම පාර |
| 57 | 7.556619° | 80.464034° | තල්ගොඩපිටිය පන්සල පිටුපස මායිම |
| 58 | 7.557319° | 80.463328° | තල්ගොඩපිටිය වෙල්යාය සීමාව |
| 59 | 7.557674° | 80.461907° | අංක 50/12, ආරියසිංහ බන්ඩාර මහතාගේ නිවස පිටුපස මායිම |
| 60 | 7.558257° | 80.461875° | අංක 59/14, තිලකරත්න මහතාගේ නිවස ඉදිරිපිට වෙල්යාය අසල මායිම |
| 61 | 7.558773° | 80.46 1542° | අංක 28/A දරන දේපල සීමාව |
| 62 | 7.559012° | 80.461136° | අංක 24/03, හීන්බංඩා මහතාගේ නිවස පිටුපස වෙල්යාය අසල මායිම |
| 63 | 7.559057° | 80.460689° | අංක 24/01, මෙත්තානන්ද නිවස පිටුපස වෙල්යාය සීමා මායිම |
| 64 | 7.559352° | 80.459854° | අංක 10/a, රිචඩ් මහතාගේ නිවස පිටුපස වෙල්යාය අසල මායිම |
| 65 | 7.560460° | 80.459498° | අංක 4, ආර්. ගොපල්ලව මහතාගේ නිවස මායිම |



Kiridigalla Forset
Kiridigalla Forset
Extent:
Perimeter :9.93 Kilometers
Area : 0.81 Square Kilometers
Data SourceGoogle Satelite Images And GPS Tracking
Desingned ByDOLG & A.W.D.J.S.Adhikaram / R.R.G.B.W.W.D.S.Weraliyadda,Ibbagamuwa Pradeshiya
25000 0 25000 50000 75000 100000 km
A
B

# අතුරු ව්‍යවස්ථා

## වරකාපොල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 69/126 වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 122 වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභාව සාදනු ලැබූ සහ 2019.01.04 වැනි දින පැවති එකී ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ තීරණ අංක ඉ-01 දරන යෝජනාව මගින් සම්මත වී ඇති, එහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989-අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123(1) වන වගන්තියේ ප්‍රකාර සබරගමු පළාත් ආණ්ඩුකාර, ටිකිරි කොබ්බෑකඩුව වන මා විසින් අනුමත කරන ලද බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරන ලද දින සිට එකී අතුරු ව්‍යවස්ථාව වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මකවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටිකිරි කොබ්බෑකඩුව,
සබරගමු පළාත් ආණ්ඩුකාර.

2022 පෙබරවාරි මස 22 වැනි දින,
සබරගමු පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ''යම් මාවතක, ප්‍රසිද්ධ ස්ථානයක සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

1. මෙම අතුරු ව්‍යවස්ථාව වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ''යම් මාවතක, ප්‍රසිද්ධ ස්ථානයක සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාවේ ලුහුඬු නාමය ''**ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය විධිමත් කිරීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**'' ලෙස හඳුන්වනු ලැබේ.

3. වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේද යන්න මින් ඉදිරියට මෙම අතුරු ව්‍යවස්ථාවේ ''**සභාව**'' යනුවෙන් හඳුන්වනු ලබන ''**වරකාපොල ප්‍රාදේශීය සභාව**'' විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකිය.

4. එලෙසින් කලින් කල දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේද යන්න සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කළ පසු, එම ප්‍රදේශ සඳහන් කරමින් එකී තීරණය නිසි පරිදි *ගැසට්* නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම, මින් ඉදිරියට ''**සභාපති**'' යනුවෙන් සඳහන් වන ''**වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපති**'' වරයාගේ කාර්යය වන අතර, එම *ගැසට්* නිවේදනය පළ වූ දින හෝ එහි නිශ්චිතව සඳහන් කර ඇති ඉදිරි දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

5. හතර වන ව්‍යවස්ථාව යටතේ සභාව විසින් කලින් කල නියම කරනු ලබන කවර හෝ ප්‍රදේශයක සභාව සතු කිසියම් ඉඩමක සහ/හෝ සභාව විසින් ඇති කරගනු ලබන ගිවිසුමක් අනුව වෙනත් කිසියම් තැනැත්තකු සතු ඉඩමක සහ/හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැලැලි/සංඛ්‍යාංක දැකුම් පැලැලි ඉදිකර පවත්වාගෙන යාමට සභාවට බලය තිබිය යුතු ය.

6. සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් යටතේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා දැකුම් පැලලි සහ සංඛ්‍යාංක දැකුම් පැලලි පවත්වාගෙන යාමට යම් අධිකාරියකට හෝ යම් තැනැත්තෙකුට බලපත්‍ර ඉල්ලා සිටීමට මෙම අතුරු ව්‍යවස්ථාව බාධාවක් නොවන අතර එසේ වුවද එම දැකුම් පැලැලි ස්ථාපිත කරනු ලබන ස්ථානය සභාව විසින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා නම් කර ඇති ප්‍රදේශයක් තුළට අයත් වන්නාවූ ස්ථානයක් විය යුතුය.

7. සභාව විසින් පවත්වාගෙන යනු ලබන දැකුම් පැලැලි සහ සංඛ්‍යාංක දැකුම් පැලලිවල ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රදර්ශකගෙන් අය කිරීමට සභාවට බලය තිබිය යුතුය. එකී ගාස්තු ඉදිරි වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂිකව පනවා සභාපතිවරයා විසින් වාර්ෂිකව ගැසට් පත්‍රයේ පල කළ යුතුය.

8. එසේ වුවද මෙම අතුරු ව්‍යවස්ථාවේ හය වන ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ ස්ථානයක සවි කිරීමට අපේක්ෂා කරන දැකුම් පැලැල්ලක සහ /හෝ සංඛ්‍යාංක දැකුම් පැලැල්ලක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා එකී ගාස්තු අදාළ නොවිය යුතුය.

9. යම් ප්‍රචාරක දැන්වීමක් සභාව සතු දැකුම් පැලැල්ලක ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙක්ම අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩ කරන දින දෙකකට පෙර මෙහි පළමු වන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම් පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

10. සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා මෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තකු විසින් වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මාවතක, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

11. ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු බලපත්‍රයක් ලබා ඇත්තේ වුවද, කවර වූ හෝ ප්‍රචාරක දැන්වීමක් ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

12. මෙම ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් සම්පූර්ණ කර නොමැත්තේ නම් සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(අ) සභාව විසින් තත් කාර්යය සඳහා තීරණය කරන ලද කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට කරන ලද බලපත්‍ර ඉල්ලීමක් විය යුතුය.

(ආ) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තකුට කලින් නියම කළ බලපත්‍රයක වලංගු කාලසීමාව අවසන් වී තිබිය යුතුය. එසේ වුවද කලින් බලපත්‍රයක් නිකුත් කර එහි වලංගු කාලසීමාව අවසන් වී නොමැතිව, තවදුරටත් ප්‍රදර්ශනය කරන අවස්ථාවක එම ප්‍රදර්ශනයට බාධාවක් නොවන ආකාරයෙන් ඒ ආසන්නයේ අදාළ දැකුම් පැලැල්ලේ හෝ අදාළ ස්ථානයේ ඉල්ලා සිටින දැන්වීම ප්‍රදර්ශනය කිරීමට මෙම විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

(ඇ) ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට ආගමකට හෝ ජන වර්ගයකට හානි වන හෝ එවැනි තත්වයක් ඇතිවීමට ඉඩ ඇති හෝ ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ස්වරූප ඇතුලත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතුය.

(ඈ) සභාව විසින් ඉදිකර ඇති දැකුම් පැලැල්ලක ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ඉල්ලා සිටින අවස්ථාවක එකී දැකුම් පැලැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩක් තිබිය යුතුය. ඒ වන විටත් කලින් නිකුත් කළ දැන්වීමක් හෝ දැන්වීම් සඳහා බලපත්‍ර කාලය අවසන් වී තිබිය යුතුය.

(ඉ) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතුය.

(ඊ) බලපත්‍රයක් ඉල්ලා සිටින සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම අදාළ දැන්වීමේ ආකෘතියක් මිලි මීටර් 210 x 297 කඩදාසියක 1:1000 පරිමානයට පිළියෙල කරන ලද දැන්වීමේ ආදර්ශයක් සහ මිලි මීටර් 210 x 297 කඩදාසියක 1:1000 පරිමාණයට පිළියෙල කරන ලද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ භූමි සැලැස්මක්/සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතුය. එම දැන්වීම් ආදර්ශයේ ප්‍රචාරක දැන්වීමේ නියම දිග පළල සඳහන් කර තිබිය යුතුය.

එසේ වුව ද සභාව විසින් පවත්වාගෙන යන දැකුම් පැලැලිවල ප්‍රදර්ශනය සඳහා බලපත්‍රයක් ඉල්ලා සිටින විට භූමි සැලැස්ම ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

(උ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සඳහා වන කාල සීමාවට අදළ ගාස්තු සභාවට ගෙවා තිබිය යුතුය. මෙහි හය වන ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ ප්‍රදර්ශන ස්ථානයක් වන විට ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බවට සෑහීමට පත්විය හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර අදළ ගාස්තුද ගෙවා තිබිය යුතුය.

13. ප්‍රචාරක දැන්වීම හේතුවෙන් කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිර වීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතුය. එමෙන්ම වාහන පදවා ගෙන යනු ලබන කිසියම් රියැදුරකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනයට අවහිර වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා යොදා තිබීම හෝ ප්‍රතිදීප්ත කිරීම් නොකළ යුතුය.

14. යම් පිළිගත හැකි සංගමයක් හෝ පුද්ගලයෙකු හෝ වෙනත් යම් අධිකාරියක් විසින් නඩත්තු කරනු ලබන්නා වූ දැකුම් පැලලි සහ/හෝ සංඛ්‍යාංක දැන්වීම් පුවරු සඳහා ද මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වන විධිවිධාන බලපැවැත්විය යුතුය.

15. සභාව විසින් සංඛ්‍යාංක දැන්වීම් පුවරුවක් හෝ පුවරු පවත්වාගෙන යන්නේනම් ඒ සඳහා වන ගාස්තු සභාව විසින් කලින් කලට එක් දැන්වීමක් සඳහා ගතවන කාලය පදනම් කරගෙන ප්‍රදර්ශනය සඳහා ගාස්තු අයකිරීමට සභාවට බලය තිබිය යුතුය. එම ගාස්තු සභාව විසින් සම්මත කර *ගැසට්* නිවේදනය මගින් ප්‍රසිද්ධ කරවීම සභාපතිවරයාගේ වගකීම විය යුතුය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ හතරවන හා හයවන ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට යටත්ව යම් පෞද්ගලික දැකුම් පැලැල්ලක් සහ /හෝ සංඛ්‍යාංක දැන්වීම් පුවරුවක් පවත්වාගෙන යමින් යම් ආදායමක් ලබා ගැනීම කරන්නේ නම් එම ස්ථානය ව්‍යාපාරික ස්ථානයක් සේ සලකා වාර්ෂික පිරිවැටුම මත ව්‍යාපර බද්දට යටත් විය යුතුය.

17. එසේ වාර්ෂික ව්‍යාපාර බද්දක් අයකරන්නේ වුවද අදාළ සංඛ්‍යාංක දැන්වීම් පුවරුව දැකුම් පැලැල්ලක් වන බැවින් දැකුම් පැලැල්ලක් සඳහා වන බලපත්‍රය ලබා තිබිය යුතුය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ ගාස්තු සම්බන්ධව කුමක් සඳහන්ව තිබුණ ද කිසියම් ආගමික කාර්යයක් හෝ මුදල් අය කිරීමකින් තොරව පවත්වනු ලබන යම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතුය. එසේ වුවද එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා ද මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අනිකුත් විධිවිධාන අදාළ විය යුතුය.

19. වර්ග අඩි අටක් හෝ අටකට වඩා වැඩි වන ආකාරයේ දැන්වීමක් හෝ දැකුම් පැලැල්ලක් හෝ වන විට සභාව විසින් තීරණය කරනු ලබන්නාවූ තැන්පත් මුදලක් අයකර ගැනීමට සභාවට බලය තිබිය යුතුය. එම තැන්පත් මුදල වාර්ෂිකව සභාව විසින් සම්මත කර ගාස්තු සමග *ගැසට්* නිවේදනය මගින් ප්‍රසිද්ධ කරවීම සභාපතිවරයාගේ වගකීම විය යුතුය.

20. ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම හෝ දැකුම් පැලැල්ල සඳහා එකී දැකුම් පැලැල්ලේ හෝ දැන්වීමේ දකුණුපස ඉහළ කෙළවරෙහි බලපත්‍ර අංකය ප්‍රර්ශනය කළ යුතුය. සංඛ්‍යාංක දැන්වීමක් වන විට දැන්වීම ප්‍රදර්ශනය අවසන් වන වාරයක් පාසා බලපත්‍ර අංකය ප්‍රදර්ශනය වීමට සැලැස්විය යුතුය.

21. *(අ)* කිසියම් ප්‍රචාරක දැන්වීමක්, දැකුම් පැලැල්ලක් එහි ආධාරකයක් ඒ සඳහා වන ඉදි කිරීමක් හෝ සවි කිරීමක් පරිසරයට හානි වන හෝ යම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තකුගේ දේපළකට බාධාකාරී හෝ අන්තරායදායක හෝ හානි වන ආකාරයෙන් පවතින විට සහ මෙම අතුරු ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් උල්ලංඝනය කර ඇති විට එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්වයට පත් කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතුය.

*(ආ)* විසිඑක් වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ වන දැන්වීමක් යවන ලද පසු එහි සඳහන් කාලය තුළ යථා තත්වයට පත් නොකරන ලද දැන්වීමකට අදාළ බලපත්‍රය අවලංගු කිරීමටත්, එකී දැන්වීම හෝ දැකුම් පැලැල්ල ගලවා ඉවත් කිරීමටත් සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතුය.

*(ඇ)* විසිඑක් වන ව්‍යවස්ථාවේ (ආ) ඡේදය අනුව ක්‍රියා කිරීමේදී සභාවට අය විය යුතු මුදල තැන්පත් කරනලද මුදලට වඩා වැඩි ප්‍රමාණයක් වන විට එකී වැඩි වන ප්‍රමාණය බලපත්‍රලාභියාගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

22. සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්තයේ නිෂ්පාදනය වන නිෂ්පාදනයන්ගේ ස්වභාවය හෝ පෙන්නුම් කරනු ලබන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම සහ ගෘහ නාම පුවරු හා කිසියම් දේපළක් බදු දීමට, විකිණීමට හෝ කුලියට දීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශනය කරනු ලබන ''බදු දීමට තිබේ'' ''විකිණීමට තිබේ'' ''කුලියට දීමට තිබේ'' යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල දහතුන් වන හා විසි එක් වන ව්‍යවස්ථාවන්වල විධිවිධාන හැර අනිකුත් ව්‍යවස්ථාවන්වල විධිවිධාන අදාළ නොවන අතර එසේ වුවද ඒ ආකාරයේ දැන්වීම් පුවරු එකකට වඩා වැඩියෙන් ප්‍රදර්ශනය කරන අවස්ථාවක දී එසේ වැඩි වන සෑම දැන්වීම් පුවරුවක් සඳහාම මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතුය.

23. සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක, ගෘහයක, නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්තයේ නිෂ්පාදනය වන නිෂ්පාදනයන්ගේ ස්වභාවය හෝ පෙන්නුම් කරනු ලබන දැන්වීම් පුවරුවක වෙනත් කිසියම් වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ඇතුළත් කර ඇති විට එකී ප්‍රචාරක දැන්වීමේ ප්‍රචාරය කර ඇති කොටස අතුරු ව්‍යවස්ථාවට යටත් විය යුතු අතර, එහිදී මෙම අතුරු ව්‍යවස්ථාවේ බලපත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස එකී දැන්වීමේ සඳහන් ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවසේ හෝ කර්මාන්ත ශාලාවේ හිමිකරු, කළමණාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතුය.

24. රජය හෝ පළාත් සභාව හෝ සභාව විසින් හෝ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

25. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක, විදුලි හෝ දුරකථන ආධාරක කණුවක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධකර සවි කිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රක්ෂේපනය කිරීම කවරකු විසින් හෝ නොකළ යුතුය.

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම ව්‍යවස්ථාවක් උල්ලංඝනය කිරීම හෝ නොකර හැරීම වරදක් වන අතර කිසියම් තැනැත්තකු නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් සහ වරදක් කරනු ලැබීමෙන් පසු එම වරද දිගින් දිගටම කරනු ලබයි නම්, එකී කඩ කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් වරකාපොළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුවද, එකී වරද කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම පනතේ නියම කර ඇති අතිරේක දඩයකින් යුත් දඬුවමක් සඳහා යටත් විය යුතුය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

''ප්‍රසිද්ධ ස්ථානය'' යන්නෙන් ජනතාව බොහෝ පිරිසක් හෝ සැළකිය යුතු තරමේ ජනතා කණ්ඩායම් වශයෙන් පරිශීලනය කරන්නා වූ පරිශීලනය සීමා නොකරන ලද ස්ථානයක්, ප්‍රදේශයක්, මාර්ගයක්, මාවතක්, වීදියක්, ගොඩනැගිල්ලක්, ජලාශ්‍රිත ප්‍රදේශයක්, ප්‍රවාහන උපයෝගී ස්ථානයක්, සාප්පු සංකීර්ණයක්, කඩ වීදියක්, මං සන්ධියක් යනාදී ස්ථාන අදහස් වේ,

''ප්‍රචාරක දැන්වීම'' යන්නෙන් කඩදාසි, රෙදි, ලී රාමු හෝ විදුලි බුබුළු හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදගෙන වර්ණ අකුරු චිත්‍ර හෝ ස්වරූප භාවිතා කරමින් කවර හෝ තැනැත්තකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක නිර්මිත ඉහලින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් හෝ ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම සඳහා හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ විදුලිය යොදාගෙන යාන්ත්‍රිකව හෝ ස්ථානගත කරනු ලබන ප්‍රචාරන කාර්යය සඳහා වන්නක් අදහස් වේ,

''දැකුම් පැලැල්ල'' යන්නෙන් ජනතාවගේ දැන ගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රඳවා තැබීම පිණිස, සවිකරනු ලබන හෝ ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

''සංඛ්‍යාංක දැන්වීම'' යන්නෙන් විදුලිය, විදුලි බුබුළු හෝ විද්‍යුත් තරංග හා ධ්වනි තරංග උපයෝගී කරගෙන චලන චිත්‍ර ස්වරූපයෙන් වන දැන්වීම් ද,

''සභාව'' යන්නෙන් ''වරකාපොල ප්‍රාදේශීය සභාව'' ද,

''සභාපති'' යන්නෙන් වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

''බලයලත් නිලධාරි'' යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරන ලද වරකාපොල ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු ද,

අදහස් වේ.

28. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් වගන්තියක අර්ථය සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇති වුවහොත් මෙහි සිංහල පාඨය සෑම අවස්ථාවකම බලාත්මක විය යුතුය.

## පළමුවන උපලේඛනය

### ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා අයදුම් පත්‍රය

(01) අයදුම්කරුගේ නම :........................................................................................................................................

(02) ලිපිනය :........................................................................................................................................

(03) ජාතික හැඳුනුම්පත් අංකය :........................................................................................

(04) දුරකථන අංකය :........................................................................................

(05) ප්‍රචාරක දැන්වීම/දැකුම් පැලැල්ල පිළිබඳ විස්තර -

1. දැන්වීමේ ප්‍රමාණය /දැකුම් පැලැල්ලේ ප්‍රමාණය - දිග සෙ.මී. .................................... පළල සෙ. මී. ......................................

2. දැන්වීම්/දැකුම් පැලැලි සංඛ්‍යාව :..................................................................................

3. දැන්වීමේ අන්තර්ගතය :........................................................................................................

4. දැන්වීම් / දැකුම් පැලැලි ස්ථානගත කරන අන්දම :......................................................................

5. දැන්වීම් / දැකුම් පැලැලි ස්ථානගත කරන ස්ථාන :..........................................................................................................

(ප්‍රචාරක දැන්වීම් සඳහා වන අතුරු ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවේ (ඊ) ඡේදයේ සඳහන් ආකෘතියක් අමුනන්න.)

(06) බලපත්‍රය ඉල්ලා සිටින කාලසීමාව : ......................................... සිට ................................................ දක්වා

(07) වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ''යම් මාවතක, ප්‍රසිද්ධ ස්ථානයක සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදාළ නියමයන් සියල්ල පිළිපදින බවටත් බලපත්‍ර කාලය අවසන් වී දින දෙකක් ගතවීමට මත්තෙන් බලපත්‍රයට අදාළ ප්‍රචාරක දැන්වීම/දැන්වීම් හා ඊට යොදාගෙන ඇති සියලු ද්‍රව්‍යයන් මාගේ වියදමින් එකී ස්ථානයෙන්/ස්ථානවලින් ඉවත් කිරීමටත් ක්‍රියා කරන බවට මෙයින් පොරොන්දු වෙමි.

..........................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :....................................

## දෙවන උපලේඛනය

### වරකාපොල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා වන බලපත්‍රය

ගෙවන ලද බලපත්‍ර ගාස්තුව - රු. ............................ ලදු පත් අංකය :............................ බලපත්‍රයේ අනුක්‍රමික අංකය :................................

ඇප තැන්පත් මුදල - රු. ................... ලදුපත් අංකය :..................................................................................

..................................................................................................හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක ............................ දරන හැඳුනුම්පත්‍රය හිමිකරු වන .................................................... යන අයට ''යම් මාවතක, ප්‍රසිද්ධ ස්ථානයක සිට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ නියමයන්ට යටත්ව,

වර්ෂ.................../........................ මස ............ වැනි දින සිට වර්ෂ ...................../........................... මස ................. වැනි දින දක්වා වන කාලය ඇතුළත වරකාපොල ප්‍රාදේශීය සභා සීමාවේ පහත සඳහන් ස්ථානයේ/ස්ථානවල ප්‍රචාරක දැන්වීම/දැකුම් පැලැල්ල/ප්‍රචාරක දැන්වීම්/දැකුම් පැලැලි ප්‍රදර්ශනය කිරීමට මෙයින් බලය දෙනු ලැබේ.

ප්‍රචාරක දැන්වීම/දැන්වීම් /දැකුම් පැලැල්ල/ පැලැලි ප්‍රදර්ශනය කිරීමට බලය ලබා දී ඇති ස්ථානය/ස්ථාන,

01. .....................................................................................................................................
02. .....................................................................................................................................
03. .....................................................................................................................................
04. .....................................................................................................................................

..............................................,
සභාපති/බලයලත් නිලධාරී.

දිනය :....................................

03-262

---

**අතුරු ව්‍යවස්ථාව**

**බලංගොඩ නගර සභාව**

255 අධිකාරය වන නගරසභා ආඥාපනතේ 157 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභාව විසින් සාදනු ලැබූ හා 2020.12.15 දින පැවති මහා සභාවේ තීරණ අංක 05 : 01 : 23 දරන යෝජනාව මගින් සම්මතව ඇති මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී නගර සභා පනතේ 154 වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව වන මවිසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටිකිරි කොබ්බෑකඩුව,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2022 පෙබරවාරි මස 22 වැනි දින,
සබරගමුව පළාතේ පළාත් සභාව.

**බලංගොඩ නගර සභා සීමාවේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 157 වන වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 153 වන වගන්තිය යටතේ බලංගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පැනවේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව බලංගොඩ නගර සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ''බලංගොඩ නගර සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

4. බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් ලබාගෙන ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලංගොඩ නගර සභා බල සීමාව ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම හෝ නොකළ යුතුය.

5. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තෙකු විසින්, අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට අවම වශයෙන් දින දෙකකට පෙර මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පත්‍රයක් සහ මෙහි 15 ඉ වගන්තියේ සඳහන් ආදර්ශයන් ඇමුණුම් වශයෙන් අමුණා බලංගොඩ නගර සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. සභාපතිවරයා විසින් නිකුත් කරන ලද ප්‍රචාරක දැන්වීම් සඳහා වන සෑම අවසරපත්‍රයක් ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව සඳහා පමණක් වලංගු විය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ අවසර පත්‍රයක් සඳහා අයකළ යුතු ගාස්තු සභාව විසින් මෙහි දෙවන උපලේඛනයේ සඳහන් විධිවිධානවලට යටත්ව සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් තීරණය කර පනවා අය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමෙන් පසු ඉහත 4 වන වගන්තිය යටතේ අවසර පත්‍රයකට යටත් වන පරිශ්‍රයක් වශයෙන් ආරම්භ කර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන කවර හෝ තැනැත්තෙක් ඒ සඳහා වන යෝග්‍යභාවය පිළිබඳව සභාපතිවරයා වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ පූර්ව අනුමැතියක් ලබාගෙන ඇත්තේ නම් මිස, ඉහත 4 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකමක් නොමැත්තේය.

9. ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු අවසර පත්‍රයක් ලබාගෙන ඇත්තේ වුවද කවර වූ හෝ ප්‍රචාරක දැන්වීමක් ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාළ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයේ හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැළැස්වීම හෝ නොකළ යුතුය.

10. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් මගින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැළකිය යුතු අතර, එලෙස තේරුම් ගැනීම නොකළ යුතුය.

11. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීම් පුවරුවක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක හෝ අත්තක හෝ වෙනත් කිසියම් කොටසක් හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රක්ෂේපණය කිරීම කවරෙකු විසින් හෝ නොකළ යුතුය.

12. ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිරවීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ සවිකිරීමට සැළැස්වීම හෝ නොකළ යුතුය.

13. මෝටර් වාහන පදවාගෙන යනු ලබන රියැදුරෙකුගේ හෝ කිසියම් පුද්ගලයෙකුගේ හෝ අවධානය වෙනස් කරන ආකාරයෙන් ඔවුන්ගේ දර්ශනයට අවහිරයක් හෝ බාධාවක් වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම හෝ කිරීමට සැළැස්වීම නොකළ යුතුය.

14. ප්‍රදර්ශනය සඳහා බලංගොඩ නගර සභාවෙන් අවසර පත්‍රයක් ඉල්ලා සිටිනු ලබන ප්‍රචාරක දැන්වීම,

(අ) ප්‍රචණ්ඩත්වය ඉස්මතු කරවන හෝ උලුප්පවා දක්වන දර්ශන හෝ ඡායාරූප ඇතුළත් ප්‍රචාරක දැන්වීමක්;

(ආ) ලිංගික හෝ නිරුවත් හෝ අසභ්‍ය හෝ කාමුකත්වය ඉස්මතු කරවන හෝ උලුප්පවා දක්වන දර්ශන හෝ ඡායාරූප ඇතුළත් ප්‍රචාරක දැන්වීමක්;

(ඇ) කිසියම් ආගමකට හෝ කිසියම් ජාතියකට හෝ අපහාස වන ආකාරයේ දර්ශන හෝ ඡායාරූප ඇතුළත් ප්‍රචාරක දැන්වීමක්;

(ඈ) කිසියම් දේශපාලන පක්ෂයකට හෝ දේශපාලන සංවිධානයකට හෝ වෙනත් කිසියම් සංවිධානයකට හෝ අපහාස වන ආකාරයේ දර්ශන හෝ ඡායාරූප ඇතුළත් ප්‍රචාරක දැන්වීමක්;

(ඉ) කිසියම් නායකයෙකුට හෝ ප්‍රභුවරයෙකුට හෝ කිසියම් පුද්ගලයෙකුට හෝ අපහාස වන ආකාරයේ දර්ශන හෝ ඡායාරූප ඇතුළත් ප්‍රචාරක දැන්වීමක්;

(ඊ) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමාකර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක්;

(උ) පොලිතීන් හෝ පොලිතීන් ආවරණය යොදන ලද ප්‍රචාරක දැන්වීමක්;

නොවිය යුතු අතර එවැනි ප්‍රචාරක දැන්වීම් කිසිවක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

15. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස, බලංගොඩ නගර සභාව විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(අ) කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලනු ලබන ස්ථානය බලංගොඩ නගර සභා බල ප්‍රදේශයට අයත්, බලංගොඩ නගර සභාව විසින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නම්කර ඇති කලාපයකට අයත් ස්ථානයක් සඳහා වන ඉල්ලීමක් විය යුතුය.

(ආ) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කළ අවසර පත්‍රයක වලංගු කාලසීමාව අවසන්ව තිබිය යුතුය.

(ඇ) එසේ වුවද කලින් නිකුත් කළ හා තවදුරටත් වලංගු අවසර පත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම දර්ශනය වීමට බාධාවක් හෝ අවහිරයක් නොවන පරිද්දෙන් ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධානය බාධාවක් නොවිය යුතුය.

(ඈ) බලංගොඩ නගර සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රදර්ශනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතුවාත් හැර, ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ කිසියම් අවසර පත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා වෙන් කළ කාලය ඉකුත් වී තිබිය යුතුය.

(ඉ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීමට අයදුම් කිරීමේ දී එකී සෑම අයදුම්පතක් සමඟම මිලි මීටර් 210 x මිලි මීටර් 297 ප්‍රමාණයේ සුදු කඩදාසියක 1:1000 පරිමාණයට අනුව පිළියෙල කළ දැන්වීමේ ආදර්ශ ආකෘතියක් සහ එම දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලි මීටර් 210 x මිලි මීටර් 297 ප්‍රමාණයේ සුදු කඩදාසියක 1:1000 පරිමාණයට අනුව අඳින ලද භූමි සැලැස්මක්/සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතු අතර ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතුය.

(ඊ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය :

(I) බලංගොඩ නගර සභාව විසින් ඉදිකළ දැකුම් පැළැල්ලක් වන විට ඒ දැකුම් පැළැල්ලේ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා බලංගොඩ නගර සභාව විසින් නියම කර ඇති ගාස්තුව බලංගොඩ නගර සභාවට ගෙවා තිබිය යුතුය; සහ/හෝ,

(II) ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් අධිකාරයකට අයත් ස්ථානයක් වන විට ඒ තැනැත්තා හෝ ඒ අධිකාරය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතුය.

16. බලංගොඩ නගර සභාව විසින් ඉදිකළ දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක බලංගොඩ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් බලංගොඩ නගර සභාවේ තැන්පත් කරනු ලබන තෙක් බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා විසින් එම ඉල්ලුම්පත්‍රයට අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

17. බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩ දෙනු ලබන කලාප හා ස්ථානයන් පිළිබඳ බලංගොඩ නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය.

18. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩ දෙනු ලබන එකී කලාප හා ස්ථානයන් පිළිබඳව කලින් කල බලංගොඩ නගර සභාව විසින් ගනු ලබන තීරණය පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම බලංගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ කාර්යය වන අතර, එකී නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

19. බලංගොඩ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක බලංගොඩ නගර සභාව සතු කිසියම් ඉඩමක හෝ බලංගොඩ නගර සභාව විසින් ඇති කර ගනු ලබන ගිවිසුමක් අනුව ලබා ගන්නා වෙනත් කිසියම් තැනැත්තෙකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැළලි ඉදිකර පවත්වාගෙන යාමට බලංගොඩ නගර සභාවට බලය තිබිය යුතුය. පෞද්ගලික ඉඩමක හෝ පරිශ්‍රයක ප්‍රදර්ශනය කරනු ලබන්නා වූ ඕනෑම පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලංගොඩ නගර සභාවේ අවසරය තිබිය යුතුය. එසේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරුවලින් සභාවට අය විය යුතු ගාස්තුව අය කර ගැනීමේ අයිතිය සභාව සතු වේ.

20. ප්‍රදර්ශනය සඳහා අවසර පත්‍රයක් අයදුම් කරනු ලබන ප්‍රදර්ශකයන් තම ප්‍රචාරක දැන්වීම හෝ දැන්වීම් වෙනුවෙන් මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට ගණනය කරන ලද ගාස්තුවක් ගෙවිය යුතුය.

21. මෙහි 16 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අය කරනු ලබන ඇප තැන්පත් මුදල ප්‍රචාරක දැන්වීමේ ප්‍රදර්ශන කාලය අවසන් වීමෙන් පසු සහ එකී දැන්වීම ගලවා ඉවත් කිරීමෙන් අනතුරුව දැන්වීම් ප්‍රදර්ශකගෙන් රජයට හෝ බලංගොඩ නගර සභාවට අයවීමට කිසියම් අලාභයක් හෝ පාඩුවක් නොමැති නම් පමණක් ප්‍රදර්ශකගේ ඉල්ලීම මත මුදාහැරිය හැකිය.

22. ඇප තැන්පත් මුදල මුදාහැරීමේ දී සභාවේ කිසියම් දේපළකට එකී දැන්වීම/දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ දී සිදුවී ඇති අලාභය හෝ පාඩුව පියවා ගැනීමට ඇප තැන්පත් මුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවක, එකී හිඟ මුදල් අවසර පත්‍රලාභියාගෙන් අයකර ගැනීමට බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා කටයුතු කළ යුතුය.

23. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති ප්‍රචාරක දැන්වීම් සඳහා වන අවසර පත්‍ර ගාස්තුව මහ සභා තීරණයක් මත සංශෝධනය කළ හැකිය.

24. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලංගොඩ නගර සභාව වෙත ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව බලංගොඩ නගර සභාවේ සභාපති හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

25. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව මෙහි 07 වන අතුරු ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති අවසර පත්‍ර ගාස්තුව සහ මෙහි 16 අතුරු ව්‍යවස්ථාව පරිදි ඇප තැන්පත් මුදලක් නියම කර ඇත්තේ නම් එකී සියලු ගාස්තු ගෙවනු ලැබීමෙන් අනතුරුව පරීක්ෂා කර බලා නියමිත අවසර පත්‍රය නිකුත් කිරීම බලංගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතුය.

26. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස එකී අවසර පත්‍රයේ කාලය මෙහි දෙවන උපලේඛනයේ දක්වා ඇති කාල රාමුවට අනුකූල විය යුතු අතර එහි උපරිම කාලය මාස දොළහක් හෝ වර්ෂයක් විය යුතුය.

27. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයේ සඳහන් කාලය අවසන්වීමෙන් පසු අනුගාමී කාලය තුළදී එම දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක එම අනුගාමී කාලය එළඹීමට අවම වශයෙන් දින 07 (හත)ට වත් පෙර එම දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව අවසර පත්‍රයක් ලබාගත යුතුය.

28. ඉහත 27 වැනි වගන්තිය පරිදි ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් වෙනුවෙන් අනුගාමී කාලය තුළ අය කිරීමට බලංගොඩ නගර සභාව විසින් සම්මත කර ඇති අවසර පත්‍ර ගාස්තුව කුමක් වුවද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලබන නව අවසර පත්‍රය වෙනුවෙන් කලින් සම්මත කළ අවසර පත්‍ර ගාස්තුව අදාළ විය යුතුය.

29. බලංගොඩ නගර සභාව විසින් කලින් කලට පනවනු ලබන අවසර පත්‍ර ගාස්තුව සහ ඇප තැන්පත් මුදල පිළිබඳ නිවේදනය *ගැසට්* පත්‍රයේ නිවේදනය කිරීම බලංගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

30. මෙහි දෙවන උපලේඛනයේ හත් (07) වන කරුණ යටතේ සඳහන් දැන්වීමේ ස්වභාවය හා ගාස්තු අවස්ථා වසරින් වසර සංශෝධනය කිරීමේ අයිතිය බලංගොඩ නගර සභාව සතු වන්නේ ය.

31. මෙම අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද,

(අ) ආගමික කාර්යයක් හෝ කිසියම් ආකාරයෙන් මුදල් අය කිරීමකින් තොරව පවත්වනු ලබන කිසියම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක්;

(ආ) කිසියම් විනෝදාත්මක කටයුත්තක් සිදුවන භූමියේ ඇතුළත අංගයන් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්;

(ඇ) ශුද්ධ අය ප්‍රමාණය පුණ්‍යමය කටයුත්තක් සඳහා පමණක් අදාළ වන විනෝදාත්මක කටයුත්තක ප්‍රචාරක දැන්වීමක්;

(ඈ) ඕනෑම ආගමික, දේශපාලනික හෝ වෙනත් මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්;

(ඉ) "බදු දීමට ඇත" යනුවෙන් වූ එක් ප්‍රචාරක දැන්වීමක්;

(ඊ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ එක් ප්‍රචාරක දැන්වීමක්;

(උ) ගෘහස්ථ නාමය සඳහන් එක් පුවරුවක්;

(ඌ) වෘත්තීයමය කටයුත්තක් සඳහා වන ප්‍රමාණය වර්ග අඩි දෙකක් නොඉක්මවන එක් නාම පුවරුවක්;

(එ) වෙළඳ කටයුතු වෙනුවෙන් යොදාගනු ලබන වාහනයක, එම වාහනයේ හිමිකරුගේ නම, ලිපිනය සඳහන්ව ඇති විට එකී දැන්වීම් දෙකක්;

(ඒ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරන ස්ථානය එම කර්මාන්තය හෝ ව්‍යාපාරය හෝ සිදුකරනු ලබන ස්ථානයේ ප්‍රදර්ශනය වන විටෙක ඉන් එක් දැන්වීමක් පමණක්;

අවසර පත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතුය.

(ඔ) ඉහත ඒ වගන්තියේ කාර්යයකට අදාළ ප්‍රචාරක දැන්වීම් ගාස්තුවෙන් නිදහස් කල හැකි වන්නේ වර්ග මීටර හතරක (04) උපරිම ප්‍රමාණයක් සඳහා විය යුතුය.

(ඕ) මෙම අතුරු ව්‍යවස්ථාවේ අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන් අදාළ විය යුතු අතර එම දැන්වීම්වල "ගාස්තුවෙන් නිදහස් - බලංගොඩ නගර සභාව" යනුවෙන් සටහන් කළ හැකිය.

32. ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහා නිකුත් කළ අවසර පත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම අවසර පත්‍රධාරියාගේ කාර්යය විය යුතු අතර එය නිවැරදිව සටහන් කර ගැනීම අවසර පත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

33. කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදාගනු ලබන කවර හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවිකිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපළකට අන්තරාදායක වන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත්කරන ලෙස අවසර පත්‍රලාභියාට යොමුකරන නිවේදනයක් මගින් නියම කිරීමට බලංගොඩ නගර සභාවට බලය තිබිය යුතුය.

34. ඉහත 33 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ සඳහන් කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කර ඇති අවසර පත්‍රය අවලංගු කිරීම සහ එම දැන්වීම ගලවා ඉවත් කිරීම නිත්‍යානුකූල විය යුතුය.

35. ඉහත 34 වන විධානය යටතේ කිසියම් අවසර පත්‍රයක් අවලංගු පත්‍රයක් කර ඇති විටෙක එම ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා බලංගොඩ නගර සභාවේ තැන්පත් කර ඇති ඇප මුදල සභාව සතු විය යුතු අතර එකී ඇප මුදල් ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

36. ප්‍රදර්ශනය සඳහා වලංගු අවසර පත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් බලංගොඩ නගර සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතුය.

37. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක් හෝ ඒ සඳහා යොදාග නු ලබන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍යවන අන්‍යාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අවසර පත්‍රලාභියා වගකීමට යටත් විය යුතුය.

38. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබාගැනීමෙන් අනතුරුව ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමේ ප්‍රදර්ශන කාලය අවසන් වන අවසාන දිනයෙන් පසු පැය හතලිස් අටක් ගතවීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය හෝ කොටස් එම ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැලැස්වීම එකී අවසර පත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

39. රජය හෝ සබරගමුව පළාත් සභාව හෝ බලංගොඩ නගර සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මෙකී අතුරු ව්‍යවස්ථාවෙහි විධිවිධාන අදාළ නොවිය යුතුය.

40. කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ/හෝ ලිපිනය සමග වෙනත් කිසියම් වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළඳ භාණ්ඩයක් හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත් විය යුතු අතර මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් අවසර පත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතුය.

41. මෙම අතුරු ව්‍යවස්ථවේ නියමයන් පරිදි බලංගොඩ නගර සභාව විසින් මහජන ප්‍රදර්ශනය සඳහා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට ඉදිකරනු ලැබ ඇති දැකුම් පැළලිවල ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ උපරිම කාලය දින 30 (තිහ) ක් විය යුතුය.

42. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම වගන්තියක් හෝ අනු වගන්තියක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩකිරීම, පැහැර හැරීම, නොකර සිටීම, නොසලකා හැරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේ ය.

43. එසේ වරදක් සිදුකර ඇති අවස්ථාවක එකී කඩකිරීම පිළිබඳව අවධානය යොමු කරන නිවේදනයක් සමග කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක් අවලංගු කිරීමට බලංගොඩ නගර සභාවේ සභාපතිවරයාට බලය තිබිය යුතු අතර 1939 අංක 61 දරන නගර සභා පනතේ 153 (2) වන වගන්තිය ප්‍රකාරව ප්‍රදේශයේ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 (1) (ආ) විධිවිධාන සලසා ඇති ආකාරයට නඩු විභාග කළ හැකි විය යුතුය.

44. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙකු විසින් අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ නියම කර ඇති දඩයකින් ද වරදකරු කරනු ලැබීමකින් පසුව ද එම වරද දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩකිරීම කෙරෙහි අවධානය යොමු කරමින් බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිළධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම 1939 අංක 61 දරන නගර සභා ආඥාපනත අනුව නියමකර ඇති අතිරේක දඩයකට යටත් විය යුතු ය.

45. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල,

(I) "සභාව" යන්නෙන්, බලංගොඩ නගර සභාවද,

(II) "සභාපති" යන්නෙන්, බලංගොඩ නගර සභාවේ සභාපති හෝ එකී ධූරය සඳහා අනුප්‍රාප්තවන්නෙකු ද,

(III) "ලේකම්" යන්නෙන්, බලංගොඩ නගර සභාවේ ලේකම් හෝ එකී ධූරය සඳහා අනුප්‍රාප්තවන්නෙකු ද,

(IV) "බලයලත් නිලධාරියා" යන්නෙන්, බලංගොඩ නගර සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද කිසියම් නිලධාරියෙකු ද,

(V) "දැකුම් පැළැල්ල" යන්නෙන්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

(VI) "ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරණ කාර්යය සඳහා යොදාගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ දර්ශන හෝ ඇතුළත් වන බැනරයක් හෝ කටවුට් හෝ පුවරුවක් හෝ විද්‍යුත් සංඛ්‍යාංක පුවරුවක් (ඩිජිටල්) හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළඳ දැන්වීමක් ද; අදහස් වේ.

46. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා පාඨ අතර අනනුකූලතාවයක් වුවහොත් සිංහල පිටපත බලාත්මක විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

05 වන වගන්තිය

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍ර ලබා ගැනීමේ අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම :..........................................................................................................................................

02. ලිපිනය :..........................................................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :............................................................................

04. දුරකතන අංකය :............................................................................

05. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ විස්තර :

i. දැන්වීමේ ප්‍රමාණය : දිග : සෙ. මී. .............................. පළල : සෙ.මී. ...................................

ii. දැන්වීමේ සංඛ්‍යාව :............................................................................................

iii. දැන්වීමේ අන්තර්ගතය :............................................................................................

iv. ස්ථාන ගත කරන අන්දම :............................................................................................

v. ස්ථාන ගත කරන ස්ථානයන් :............................................................................................

(15 වන අතුරු ව්‍යවස්ථාවෙහි "ඉ" අනු අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ ආදර්ශයන් අමුණන්න.)

06. ඉල්ලා සිටින අවසරපත්‍රය වලංගු විය යුතු කාල සීමාව :

ආරම්භක දිනය 20................................................ මස ................ දින

අවසන්වන දිනය 20................................................ මස ................. දින

බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සියල්ල පිළිපදින බවටත්, අවසර පත්‍රය වලංගු කාලය අවසන් වී දින දෙකක් ගතවීමට මත්තෙන් අවසර පත්‍රයට අදාළ ප්‍රචාරක දැන්වීම/දැන්වීම් හා ඊට යොදාගෙන ඇති සියලු ද්‍රව්‍යයන් මාගේ වියදමින් එකී ස්ථානයෙන්/ස්ථානවලින් ඉවත් කිරීමටත් ක්‍රියා කරන බවට මෙයින් පොරොන්දු වෙමි.

.............................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :...................................

**දෙවන උපලේඛනය**

07 වන වගන්තිය

| *අනු අංකය* | *දැන්වීමේ ස්වභාවය* | *වර්ග අඩි ප්‍රමාණය* | *ගාස්තුව ශ්‍රී ලංකා රුපියල්* | | |
|---|---|---|---|---|---|
| | | | *ප්‍රදර්ශන කාලය මාසයක් හෝ ඊට අඩු* | *ප්‍රදර්ශන කාලය මාස 01 ට වැඩි සහ මාස 06 ට අඩු* | *ප්‍රදර්ශන කාලය මාස 06 ට වැඩි මාස 12 ට අඩු* |
| 01 | රෙදි හෝ ඩිජිටල් බැනර් සඳහා | 01 හෝ 01 ට අඩු | 50 0 | 100 0 | 150 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 45.00 බැගින් | | |
| 02 | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 01 හෝ 01 ට අඩු | 200 0 | 500 0 | 1,000 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 150.00 බැගින් | | |
| 03 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන (LED/ LCD) ප්‍රචාරක දැන්වීම් සඳහා | 01 හෝ 01 ට අඩු | 500 0 | 750 0 | 1,000 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |
| 04 | ෆෝම් බෝඩ් හෝ පොලිතීන් මිශ්‍රිත බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 01 හෝ 01 ට අඩු | 250 0 | 500 0 | 850 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 05 | ප්ලාස්ටික් හෝ ෆයිබර් යොදාගත් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 01 හෝ 01 ට අඩු | 400 0 | 600 0 | 1,200 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 250.00 බැගින් | | |
| 06 | විද්‍යුත් උපකරණ යොදාගෙන කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 01 හෝ 01 ට අඩු | 750 0 | 900 0 | 1,250 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 450.00 බැගින් | | |
| 07 | විද්‍යුත් සංඛ්‍යාංක (ඩිජිටල්) ප්‍රචාරක දැන්වීම් සඳහා | 01 හෝ 01 ට අඩු | 150 0 | 150 0 | 150 0 |
| | | 01 ට වැඩි | වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |

03-261

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.